රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:(94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்:(94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்:dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk Web Site

---

මගේ අංකය / எனது இல / My No: PS/GT/2020 (වෙළුම IV)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.03.22

සියලු ම කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්, රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රැකියා විරහිත උපාධිධාරින් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020</u>**
**<u>දෙවන අදියර සහ තෙවන අදියර යටතේ බඳවාගත් උපාධිධාරීන්ට ස්ථිර පත්වීම් ලබා දීම</u>**

උක්ත වැඩසටහන යටතේ 2021 පෙබරවාරි සහ 2021 මාර්තු මාසවල දී පුහුණුව සඳහා බඳවාගෙන ඒකාබද්ධ සේවය යටතේ රජයේ ආයතනවලට හා ජාතික පාසල්වලට ස්ථිර පදනමින් අනුයුක්ත කර ඇති අභ්‍යාසලාභී උපාධිධාරින් 2022.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරී සේවයට ස්ථිර පදනමින් පත් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුව ඇත. එම නිලධාරීන් මේ වන විටත් ස්ථිර පදනමින් සේවා ස්ථාන වලට අනුයුක්ත කර ඇති බැවින් ඔවුන්ගේ ස්ථිර පත්වීම් ලිපි එම අනුයුක්ත කළ සේවා ස්ථානවල ප්‍රධානීන්ට ලැබීමට සලස්වනු ලැබේ. කොළඹ, කළුතර, ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හැර සෙසු දිස්ත්‍රික් ලේකම් කාර්යාල, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යන ආයතන වෙත තැපැල් මගින් ස්ථිර පත්වීම් ලිපි ලැබීමට සලස්වන අතර සෙසු ආයතන වෙත පහත දැක්වෙන සටහනට අනුව පත්වීම් ලිපි ලබාදීමට නියමිතය.

| # | දිනය | උදය වරුව | සවස් වරුව |
|---|---|---|---|
| 01. | 2022.03.28 (සඳුදා) | • සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br>• ගොවිජන සංවර්ධනදෙපාර්තමේන්තුව<br>• රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව | • සෙසු දෙපාර්තමේන්තු<br>• කොමිෂන් සභා |
| 02. | 2022.03.29 (අඟහරුවාදා) | • සෙසු දෙපාර්තමේන්තු | • ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>• අධ්‍යාපන අමාත්‍යාංශය<br>• කෘෂිකර්ම අමාත්‍යාංශය<br>• කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය<br>• පරිසර අමාත්‍යාංශය<br>• සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය<br>• රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමණාකරන රාජ්‍ය අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 03. | 2022.03.30<br>(බදාදා) | • සෙසු රාජ්‍ය අමාත්‍යාංශ | • සෙසු රාජ්‍ය අමාත්‍යාංශ |
| 04. | 2022.03.31<br>(බ්‍රහස්පතින්දා) | • කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>• කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>• සෙසු අමාත්‍යාංශ | • සෙසු අමාත්‍යාංශ |

02. ඒ අනුව මුද්‍රිත ස්ථිර පත්වීම් ලිපි රැගෙන යාම සඳහා ඉහතින් දැක්වෙන කාල සටහනට අනුව සුදුසු මාණ්ඩලික නිලධාරියෙකු මෙම අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය වෙත එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. පත්වීම් ලිපි ලබා ගැනීමට පැමිණීමේ දී ඔබ කොමිෂන් සභා/අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවේ සේවය කරන 2022.04.01 දිනැතිව සංවර්ධන නිලධාරී සේවයට පත්වීමට නියමිත නිලධාරින්ට අයත් තොරතුරු මේ සමග ඇති ඇමුණුම අනුව සම්පූර්ණ කර මා වෙත ලබා දිය යුතු වන අතර එම ලේඛනය සමග සසඳා පත්වීම් ලිපි ලබා දීමට කටයුතු කරන බව සැලකුව මැනවි.

<u>සැ.යු</u>

- යම් අභ්‍යාසලාභියෙකු 2021 වර්ෂයේ පෙබරවාරි/මාර්තු මාසවල පුහුණුවට වාර්තා කර වසරක් එළඹෙන දින සිට 2022.04.01 දින දක්වා වන දින ගණන මගින් හිලව් කළ නොහැකි වැටුප් රහිත නිවාඩු ප්‍රමාණයක් ලබා ඇත්නම් නියමිත පුහුණු කාලය ඉක්මවා ලබා ඇති වැටුප් රහිත නිවාඩු ගණන V තීරුවේ ඇතුළත් කළ යුතුය.
- ඇමුණුම පත්වීම් අංක (CS/DOS/…………) පිළිවෙලට සකස් කර ඉදිරිපත් කළ යුතු වේ.
- එසේම පත්වීම් ලිපි නිකුත් කරනු ලබන්නේ නිලධාරියා ස්ථිර පදනමින් අනුයුක්ත කරන ලද සේවා ස්ථානයේ ප්‍රධානියා වෙනුවෙන් පැමිණෙන නිලධාරියාට පමණක් බව කාරුණිකව සලකන්න.

උදා -:

මධ්‍යම පරිසර අධිකාරියට අනුයුක්ත කර ඇති නිලධාරියකුගේ ස්ථිර පත්වීම් ලිපිය නිකුත් කරනු ලබන්නේ පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් පැමිණෙන නිලධාරියෙකුට පමණි.

04. එපරිදි කටයුතු කිරීම මැනවි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

<u>රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන **-2020**</u>

<u>දෙවන අදියර සහ තෙවන අදියර යටතේ බඳවාගත් උපාධිධාරීන්ට ස්ථිර පත්වීම් ලබා දීම</u>

| අනු අංකය | පත්වීම් අංකය **I** | මුලකුරු සමඟ නම **II** | ජාතික හැඳුනුම්පත් අංකය **III** | පුහුණු පත්වීම් අංකය **IV** | පුහුණු කාලය තුළ අමතරව ලබා ඇති වැටුප් රහිත නිවාඩු ගණන **V** | පුහුණු කාලය සතුටුදායකද? (ඔව්/නැත) **VI** |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |
| 6 | | | | | | |
| 7 | | | | | | |
| 8 | | | | | | |
| 9 | | | | | | |
| 10 | | | | | | |
| 11 | | | | | | |
| 12 | | | | | | |
| 13 | | | | | | |
| 14 | | | | | | |
| 15 | | | | | | |

.................................................... නිල මුද්‍රාව :

ආයතන ප්‍රධානී නිර්දේශය